**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන, 2015 අප්‍රේල් 10 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ශුද්ධ වත්කම්වල අඩුවීම

--------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට සභාවේ ශුද්ධ වත්කම් රු.266,941,401 ක්වූ අතර සමාලෝචිත වර්ෂය ආරම්භයේ ශුද්ධ වත්කම් රු.270,347,907 ක් වූයෙන් වර්ෂය තුලදී සභාවේ ශුද්ධ වත්කම් රු.3,406,506 කින් අඩුවී තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රු.22,312,812 ක් වැයකර ඉදිකර තිබුණු වෙන්නප්පුව බස් නැවතුම්පොලෙහි වටිනාකම හා රු.10,167,200 ක් වටිනා පොදු කටයුතු සඳහා වෙන්කරන ලද කිරිමැටියාන වත්ත නැමැති ඉඩමේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පළාත් පාලන සේවකයින්ගේ විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවියයුතු මුදල වන රු.7,334,419 ක් ණය හිමියන්ගෙන් හා සමුච්චිත අරමුදල් ගිණුමෙන් අත්හැරී තිබූ අතර, 2011 වර්ෂයේ සිට 2013 දක්වා ලැබියයුතු මුද්දර ගාස්තු රු.16,429,140 ක් ලැබියයුතු මුද්දර ගාස්තු ගිණුමෙන් හා සමුච්චිත අරමුදල් ගිණුමෙන් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මූලධන ආධාර රු.92,900,035 ක් වුවද, ගිණුම්වල එය රු.79,324,995 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූලධන ආධාර ගිණුම හා ලැබියයුතු මූලධන ආධාර ගිණුම රු.13,575,040 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) 2013 වර්ෂයේදී ණයහිමියන් හා ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු රු.740,000 ක මුදල 2014 වර්ෂයේදී නිරවුල් කිරීමේදී තවදුරටත් ප්‍රාග්ධන වැයක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයහිමියන් හා ප්‍රාග්ධන වැය රු.740,000 බැගින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී විකුණන ලද පිරිවැය රු.2,490,000 ක් වූ යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබූ බැකෝලෝඩරයේ වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමේදී නැවත මෝටර් රථ හා කරත්ත ගිණුමට හර කිරීම නිසා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුම රු.2,490,000 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර, ප්‍රාග්ධනයට ආදායමෙන් දායකවීමේ ගිණුමද, එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) අස්ථානගත වී තිබුණු රු.156,550 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයේ වටිනාකම ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබූ අතර, පරිත්‍යාගයක් ලෙස 2012, 2013 වර්ෂයන්හි සභාවේ පරිසර ඒකකය සඳහා ලද රු.770,240 ක් වටිනා කසල බඳුන් 600 ක් ද ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් තුනක ශේෂයන්හි වටිනාකම ඊට අදාල උපයෝගී ලේඛන සමග නොසැසඳුන අතර, නොසැසඳු වෙනසෙහි වටිනාකම රු.26,473,320 ක් විය.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම

---------------------

ලංකා බැංකුවේ වෙන්නප්පුව ශාඛාවේ පවත්වාගෙන යන අංක 0001865986 දරන ජංගම ගිණුමට අදාලව 2014 දෙසැම්බර් මස බැංකු සැසඳුම තුල අනාවරණය වූ රු.384,602ක

අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට හෝ ඒ පිළිබඳ පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

---------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගිණුම් විෂයයන් 03 කට අදාල වටිනාකම රු.195,251,700 ක් සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොමැතිවීම නිසා ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,599,107 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 26,359,024 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් රු.80,436,306 ක් හා රු.17,675,347 ක් වූ මූලධන ආධාර හා රු.118,490,311 ක් හා රු.39,876,108 ක් වූ මූලධන වියදම් ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.545,122 ක් වී තිබුණ අතර, ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,158,283 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,613,161ක අඩුවීමක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත හිඟයන් ලෙස වරිපනම් බදු රු.මි. 5.9 ක්ද, බදුකුලී රු.මි.1.98 ක්ද, වෙනත් ආදායම් රු. මි. 2.4 ක්ද වශයෙන් පැවතුණි.

**2.2.2 වරිපනම් බදු**

**--------------**

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අයකලයුතු හිඟ වරිපනම් බදු රු.194,321 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු බිල් කිරීමේ සමස්ථ අඩුවීම රු.223,179 ක් විය.

(ආ) 2009 සැප්තැම්බර් 25 දිනැති අංක 1574 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද උපදෙස් ප්‍රකාරව දියුණු ගම් ප්‍රදේශවල නව වරිපනම් බදු ඒකක කඩිනමින් හඳුනාගෙන බදු අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

**2.2.3 දේපල බදු දීම**

**----------------**

සමාලෝචිත වර්ෂයේදී සභාව සතු බදු දේපල 84 න් 23 ක් බදු දී නොතිබූ අතර, අවම ලංසු වටිනාකම පදනම් කරගත්තේ නම් අහිමි වූ ආදායම රු.1,880,457 ක් විය. එසේම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සභාවට අහිමි වූ බදුකුලී ආදායම රු. 4,461,876 ක් විය.

**2.2.4 උසාවි දඩ**

**-----------**

වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු.9,220,635 ක් හා මුද්දර ගාස්තු වටිනාකම රු.94,139,463 ක් විය.

**2.2.5 අධිභාර**

**--------**

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිවයුතු අයවළුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2009 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ මුදල රු. 326,335 ක් විය.

(ආ) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම ප්‍රමාදවීම හේතුකොටගෙන ගෙවා තිබූ රු.340,423ක අධිභාර පැනවීම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් ඉදිරියේදී අධිභාර පැනවීමට පියවර ගැනීමට යෝජිතය.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුව වෙන්නප්පුව ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 0001865986 දරන ජංගම ගිණුමේ හා අංක 0001865988 දරන ජංගම ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශනයන්ට අනුව පිළිවෙලින් රු.33,955 ක් හා රු.8,345 ක අගරු චෙක් සඳහා වූ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙන්නප්පුව වෙළඳ සංකීර්ණයේ වර්ග අඩි 4440 කින් යුක්ත උඩුමහල වර්ෂ 03කට අධික කාලයක සිට බදු දීමකින් තොරව වෙළඳ සංගම් හා වෙනත් සංවිධාන වෙත පවරා තිබුණි. මෙසේ සභාව සතු වත්කම් බාහිර පාර්ශව වෙත නොමිලේ පවරා දීමෙන් සභා අරමුදලට ලබාගත හැකිව තිබූ ආදායම් අහිමිවී තිබුණි.

**4.** **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය

(ඊ) වත්කම් කළමනාකරණය